# එජාප පැරැණි සාමාජිකයන් රැකබලා ගන්න භාරයක්

දකුණු කොළඹ (නැගෙනහිර කොළඹ හා බටහිර කොළඹ) මැතිවරණ කොට්ඨාසයේ එක්සත් ජාතික පක්ෂයේ පැරණි තම සාමාජිකයන් රැක බලා ගැනීම සහ දේශපාලන පලි ගැනීම්වලදී විපතට පත්වන පාක්ෂිකයන්ට සහන සැලසීම අරමුණු කරගෙන දිවංගත ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාගේ නමින් විශේෂ භාරයක් ආරම්භ කිරීමට තීරණය කර තිබේ.

එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතාගේ අදහසක අනුව මේ මස 17 දා සෙනසුරාදා පෙරවරු 9.00ට මෙම භාරය විපක්ෂනායක රනිල් වික්‍රමසිංහ මහතා විසින් කොළඹ 05, තිඹිරිගස්යාය අංක 161 දරණ ස්ථානයේදී නිල වශයෙන් ආරම්භ කිරීමට නියමිතය.

රවි ජයවර්ධන, ඩී.එච්.එන්. ජයමහ, අබ්දුල් නවුපර්, රහුමාන්, ජේ.ජේ. රාජකරුණා, සී. විජිත ප්‍රනාන්දු, රොනාල්ඩ් පෙරේරා, සරත් කුරේ යන මහත්වරු සහ එ.ජා.ප. ලේකම් (නිල බලයෙන්) මෙම භාරයේ භාරකත්ව මණ්ඩලය වශයෙන් නම් කරනු ලැබ සිටිති.

ප්‍රථමයෙන් දකුණු කොළඹ ප්‍රදේශයේ එ.ජා.ප. අවුරුදු 50ට වැඩි සාමාජිකත්වය හිමි පැරණි සාමාජිකයන්ගේ කැපවීම ඇගයීම සඳහාත් එ.ජා.ප. සාමාජිකයන්ගේ ආපදා අවස්ථාවලදී ඉක්මණින් සහන සැලසීමත් අරමුණු කරගෙන මෙම භාරය විශේෂ වැඩසටහන් සම්පාදනය කෙරේ.

ජේ.ආර්. ජයවර්ධන මහතා විසින් පක්ෂයට ඉටු කරන ලද සේවාව වෙනුවෙන් එතුමාගේ ජන්ම දිනයේදී මෙම භාරය ස්ථාපනය කෙරේ.